**8 ශ්‍රේණිය - නර්තනය**

## පාඩම : භරත නාට්‍යම් හඳුනා ගනිමු

**( නිපු. අං. 6.2 )**

**හැඳින්වීම**

ඉන්දියාව කලා කෝෂ්ඨාගාරයකි. නර්තනය , සංගීතය , නාට්‍ය කලාව , චිත්‍ර , මූර්ති , කැටයම් ආදී සෑම කලාවකම පෙරදිග අනන්‍යතාවය විදහාපාන කැඩපත භාරතයයි.

භාරතය තුළ නර්තන සම්ප්‍රදායන් ඉතා විශාල ප්‍රමාණයක් දැකගත හැකිය.

- **භරත**
- **කතක්**
- **කතකලි**
- **මණිපුරි**
- **ඔඩිස්සි**
- **යක්ෂගාන**
- **කුචිපුඩි**
- **මෝහිනී ආට්ටම් ,**

යන නර්තනයන් ඒ අතරින් සමහරකි. එම නර්තන සම්ප්‍රදායන් අතරින් මහා නර්තන සම්ප්‍රදායන් වශයෙන් **හතරක්** හඳුනාගත හැකිය. ඒවා නම් ,

- **භරත**
- **කතක්**
- **කතකලි**
- **මනිපුරි**

ඉහත දක්වා ඇති එම නර්තන සම්ප්‍රදායන් හතරය.

**දකුණු ඉන්දියාවේ** ප්‍රචලිත නර්තන සම්ප්‍රදායන් ලෙස **භරත හා කථකලී** සම්ප්‍රදායන් ද **උතුරු ඉන්දියාවේ** ප්‍රචලිත නර්තන සම්ප්‍රදායන් ලෙස **කතක් හා මණිපුරි** නර්තන සම්ප්‍රදාය හැඳින්විය. හැකිය.

## භරත නාට්‍යයම්



ඉහත සඳහන් කරන ලද මහා නර්තන සම්ප්‍රදායන් අතරින් සුවිශේෂී නර්තන සම්ප්‍රදායක් ලෙස **භරත නාට්‍යම්** හැදින්විය හැකිය.

භරත නර්තන සම්ප්‍රදාය බිහිවීම **දේව සම්බන්ධතාවය** මත සිදු වූ බව **පුරාවෘත්ත කතාවල** සඳහන් වේ. **හින්දු ආගමික කතා පුවත්** භරත නාට්‍යයම් හි නර්තනාංග වලින් නිරූපනය කෙරේ. **ශිව-පාර්වතී** මෙහිදී ප්‍රධාන කොට පූජාවට ලක්වන දෙවිවරුන්ය. ඊට අමතරව **ක්‍රිෂ්ණ දෙවියන්** සම්බන්ධ කතාපුවත් ද නිරූපණය කෙරේ.

**භාව , රාග , තාල** යන අංග තුනම භරත නර්තනය තුළ අන්තර්ගත වේ. මේ හේතුවෙන් එම කොටස් තුනේ මුල් අකුරු තුන එක් වී භරත නාට්‍යයම් යන නම සෑදුනු බව කියනු ලැබේ. එමෙන්ම භරත නර්තනය **භරතමුනි** පඬිවරයා විසින් රචනා කරන ලද **නාට්‍ය ශාස්ත්‍රය** නම් කෘතියෙහි එන රංග විධි නියමයන්ට අනුගතව ඉදිරිපත් කරනු ලැබේ. එබැවින් ඇතැම් විද්වතුන් පවසන්නේ භරත නර්තන සම්ප්‍රදාය භරතමුනි විසින් සකස් කර හඳුන්වා දෙන ලද්දක් බවයි.

### භරත නාට්‍යයම් ආරම්භය හා සංවර්ධනය



භරත නාට්‍යම් හි ආරම්භය සිදු වූයේ **හින්දු කෝවිල්** ආශ්‍රයේ ය. **දෙවියන් පිදීම සඳහා** මෙම නර්තනය යොදා ගෙන තිබේ. නර්තනයේ යෙදී ඇත්තේ **කාන්තාවන් ය.** ඔවුන් **දේවදාසින්** ලෙස හඳුන්වා තිබේ. එම නිසා භරත නාට්‍යම් එදා , **දාසි ආට්ටම්** ලෙස හඳුන්වා තිබේ. **මහාභාරතය , භගවත් ගීතාවලිය , ගීතගෝවින්දය** වැනි ග්‍රන්ථවල එන දේව කථා පුවත් දෙවියන් ඉදිරියේ රඟ දක්වා පූජා පැවැත්වීම දේවදාසින් විසින් සිදු කරන ලදී. **දෙවියන් වෙනුවෙන්ම සේවයට වෙන්වී සිටින අර්ථයෙන් දේවදාසි යන නම ලැබී තිබේ.**

### භරත නාට්‍යම් ප්‍රචලිත ප්‍රදේශ

භරත නාට්‍යයම් **ආන්ද්‍ර දේශයෙන්** බිහිව **තාන්ජෝරයට** පැමිණ **මදුරාසිය** හා **තාන්ජෝරය** කේන්ද්‍ර කොටගෙන ප්‍රචලිත වී තිබේ .

## හරත නාට්‍යම් සංවර්ධනය

දේවදාසීන් විසින් දෙවියන් පිදීමේ මාර්ගයක් ලෙස ආරම්භ වූ දාසි ආට්ටම් පසු කාලයේ දී විනාශයට පත්වන්නට විය. මෙම තත්වය මග හරවා නැවත හරත නාට්‍යම් සංරක්ෂණය කරන ලද්දේ **තාන්ජාවූර් සහෝදරයින්** සිවුදෙනා විසින් ඔවුන්ගේ නම් මෙසේය.

- **චින්නයියා**
- **පොන්නයා**
- **ශිවනාදන්**
- **වඩිවේලු**



මොවුන් **පන්දනාලූර්** පෙළපතට අයත් වූ නර්තන ගුරුවරුන් ය. ඔවුහු විසින් මෙසේ සංරක්ෂණය කරන ලද දාසි ආට්ටම් නර්තන **සදීර් ආට්ටම්** ලෙස එකල හඳුන්වන්නට විය. විනාශ වීමට ගිය **හරත නර්තනාංග** මොවුන් විසින් **අනුපිළිවෙලට සකස් කරන ලදී.** ඔවුන්ට **ගෞරවයක් වශයෙන්** අද දක්වාම භාවිතා කරනු ලබන්නේ එම අනු පිළිවෙළ ය.

මොවුන් විසින් මෙසේ සංරක්ෂණය කර ලැබූ හරත නර්තන සම්ප්‍රදාය ක්‍රමානුකූල නර්තන සම්ප්‍රදායක් බවට පත්කිරීමේ ගෞරවය හිමි වන්නේ **පන්ඩනාලූර්** පෙළපතට අයත් **ශ්‍රී මීනාක්ෂි සුන්දරම් පිල්ලේ** නම් ගුරුවරයාට ය. **සදීර් ආට්ටම් සඳහා හරත නාට්‍යයම් ලෙස නම දෙන ලද්දේ එතුමන් ය.** තම නිවස ශිල්ප ලබා දෙන පාසල බවට පත්කර ගෙන සිසුන්ට නේවාසික පහසුකම් සහ ආහාර පාන ද ලබා දී මෙම නර්තන සම්ප්‍රදාය සංරක්ෂණයට සහ දියුණු කිරීමට මෙතුමා ඉමහත් කැප කිරීමක් කරන්නට විය.

## හරත නාට්‍යම් එහි සංගීත සම්ප්‍රදාය




හරත නාට්‍යම් සඳහා යොදාගනු ලබන්නේ **දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීත සම්ප්‍රදාය යි.** එහි **තාල හතක්** සහ **ජාති පහක්** දැකගත හැකිය දැක ගත හැකිය. ප්‍රධාන වාද්‍ය භාණ්ඩය **මෘදංගය** නම් වේ. සහය වාද්‍ය භාණ්ඩ ලෙස **වීණාව , වයලීනය , බටනළාව , නට්ටුවාංගම , තාම්පුරාව** යනාදී වාද්‍ය භාණ්ඩ යොදා ගනු ලැබේ. මෙහිදී **තෙළිඟු , මලයාලම් හා සංස්කෘත** භාෂා වලින් රචිත **ගීත , රාග හා ශ්ලෝක** භාවිතා කරන ලැබෙයි. හරත නාට්‍යයම් සංගීත ශිල්පියා **මුත්තුකාරන්** ලෙස හඳුන්වයි. හරත නාට්‍යම් උගන්වන ගුරුවරයා **නටුවනාර්** ලෙස හඳුන්වනු ලැබේ. ඔහු **නර්තනය , ගායනය , වාදනය හා ඉගැන්වීම** පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු අයෙකි. **නට්ටුවාංගම** වයනු ලබන්නේ මොහුය. නට්ටුවාංගම යොදාගනු ලබන්නේ **තාල තැබීමට** ය. එහෙත් එයින් ද වාදනය කරනු ලබන විශේෂ පද තිබේ. මෙය තරමක් අප භාවිතා කරන තාලම්පටට සමාන බව පෙනේ.

## භරත නර්තනයේ පුහුණුව සහ භරත නර්තනාංග




භරත නර්තනයේ මූලික ඉරියව්ව **අරමණ්ඩියයි.** භරත නර්තනයේ මූලික සරඹ **අඩව්** ලෙස හඳුන්වනු ලැබේ. පා හුරු වීම සඳහා **තට් අඩව්** ද , දැත් හුරු වීම සඳහා **නාට් ( නාට්‍ය ) අඩව්** ද භාවිතා කෙරේ. මීට අමතරව තව අඩව් වර්ග ගණනාවක් දැක ගත හැකිය.

- ✓ **මණ්ඩි අඩව්**
- ✓ **තෙයිහත් තෙයිහි අඩව්**
- ✓ **පරවල් අඩව්**
- ✓ **ගුදික්කමෙට්ට අඩව්** , ඒවායින් සමහරකි.

භරත නාට්‍යම් තුළ කතා පුවත් රඟ දැක්වීම කරනු ලැබේ. එනම් අදහස් ප්‍රකාශ කරන නර්තන සම්ප්‍රදායකි. ඒ සඳහා **මුහුණේ භාව ප්‍රකාශනයන් ද , හස්ත මුද්‍රා භාවිතය පිළිබඳව ද , පාද භාවිතය** පිළිබඳව ද ඉගෙන ගත යුතුය.

## අධ්‍යාපන ආයතන

භරත නර්තනය උගන්වනු ලබන ප්‍රධාන අධ්‍යාපන ආයතනය **අඩයාර් හි කලා ක්ෂේත්‍රය** නම් වේ. එය ආරම්භ කර තිබෙන්නේ **රුක්මණී දේවි අරුන්ඩේල්** නම් ශිල්පිනියයි.




## භරත නර්තන ප්‍රසංගයක අනුපිළිවෙල

- **අලාරිප්පු**
- **ජතිශ්වරම්**
- **ශබ්දම්**
- **වර්ණම්**
- **පදම්**
- **තිල්ලානා**
- **ශ්ලෝකම්**




## භරත නර්තනයේ දක්ෂ ශිල්පීන්




- රුක්මණී දේවි අරුන්ඩේල්
- බාලා සරස්වති
- අමිලා දේවි
- ශ්‍රීමතී ශාන්තා
- ශ්‍රී මීනාක්ෂි සුන්දරම් පිල්ලේ

## භරත රංග වස්ත්‍රාභරණ

අතීතයේ දී තනි පාට තද වර්ණ සාරියක් යොදාගෙන තිබේ. එය **තුයියා සේලෙයි** ලෙස හඳුන්වා තිබේ. වර්තමානයේ ඉතා අලංකාරවත් රංග වස්ත්‍රාභවස්ත්‍රාභරණ භාවිතා කරන පෙනේ. ප්‍රධාන රංගවස්ත්‍රාභරණ කට්ටල තුනක් හඳුනාගත හැකිය.




- ✓ සාරි උඩෙයි
- ✓ පිජාමා උඩෙයි
- ✓ පාවාඩ දාවනී උඩෙයි

## භරත නාට්‍යම් ආභරණ

භරත ශිල්පිනිය විශාල අභරණ ප්‍රමාණයකින් සැරසෙනු ලැබේ.

- සූරිය පිරෙයි
- චන්ද්‍ර පිරෙයි
- නෙත්ති පට්ටම්
- උච්ච පට්ටම්
- රාක්ඛඩි
- තෝඩු
- ජිමිකි
- මාට්ටල්
- මූකුත්ති
- නත්තු පිල්ලාක්කු ( බිලාක්කු )
- මූක්කු මාට්ටල්
- අට්ටියල් ( මුත්තු මාලෙයි )
- පදක්කම් මාලෙයි
- කාසි මාලෙයි
- ඔට්ටියානම්
- වංගි
- වලෙයියල්
- මෝදිරම්
- සලංග
- කොලුසු
- මිංජි




**පුරුෂ ආභරණ**

පුරුෂ පක්ෂය සීමිත ආභරණ ප්‍රමාණයක් පළඳී.



- **ධෝතිය**
- **ඔට්ටියානම්**
- **පදක්කම් මාලෙයි**
- **වංගී**
- **සලංග**
- **පූනනූල**

( නළලේ සිරස් අතට තිලක තබනු ලැබේ )

**භරත නාට්‍යම් හි වේශ නිරූපණය**

භරත නාට්‍යම් හි වේශ නිරූපණය **උප්පනයි** ලෙස හැඳින්වේ .අතීතයේ දී බුලත්විට සපා තොල් රතු කර තිබේ. මුත්තුවල්ලි නම් කුඩු විශේෂය මුහුණේ තවරා තිබේ. වර්තමානයේ දියුණු වේශ නිරූපණ ක්‍රම යොදා ගනු ලැබේ.



**( සැ.යු. - අවසාන පින්තූරය හැර අනෙක් සියල්ලම අන්තර්ජාලයෙන් උපුටා ගත් පින්තූර වේ )**


සැකසුම :

රවිඳු පලිහවඩන

නර්තනය විෂය ආචාර්ය

හලා/වෙන්/ මැල්ලව කණිෂ්ඨ විද්‍යාලය